**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය. |
|---|---|---|
| (අ) පෙර වර්ෂ වෙනුවෙන් වැය කිරීමට නියමිත පාඨමාලා වියදම් රු.1,982,765ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හැර තිබීම සහ පෙර වර්ෂ වෙනුවෙන් ලැබීමට නියමිත රු.3,319,875ක පාඨමාලා ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගලපා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,337,110කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සමග එකග වන අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල ගැලපීම් නිසිපරිදි සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල ආදායම් හා වියදම් හදුනාගෙන නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් යෙදවූ මුදල් ප්‍රවාහයට අයිතම 03කට අදාල එකතුව රු.865,700ක් සහ මූල්‍ය ක්‍රියාකාරකම් වල පොලී ආදායමට රු.270,027ක් නිවැරදිව ගලපා නොතිබුණි. | විගණනය මඟින් පෙන්වා දි ඇති කරුණු සමඟ එකඟ වන අතර, ඉදිරි මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී අදාළ ගැලපීම් නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය පනතේ II කොටසේ 3 ඡේදය | පාලක සභාව විසින් පවරන ලද බලතල හා කර්තව්‍යයන් අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කිරීමද, ඉටු කිරීමද කළ යුතු නමුත් පාලක සභාවේ අනුමැතියකින් තොරව 2020 සැප්තැම්බර් 07 දින අධ්‍යක්ෂවරයා විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන සමඟ අවබෝධතා ගිවිසුමට අත්සන් කර ක්‍රියාත්මක කර තිබුණි. | 2019 ඔක්තෝබර් මාසයට පසුව නැවතත් පාලක සභා රැස්වීමක් පවත්වා ඇත්තේ 2021.ජුනි මස වන බැවින් වසර එකහමරාකට අධික කාලයක් පාලක සභා රැස්වීම් පවත්වා නොමැති බව පෙනී යයි.මෙම ව්‍යාපෘතියේ කාලය වසර දෙකකින් අවසන් වන බැවින් එවකට සිටි අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ජා කර එම කාලවකවානුවේ හිටපු අධ්‍යක්ෂවරයා විසින් පාලක මණ්ඩලය රැස්වූ විට අනුමැතිය ලබාගැනීමේ අපේක්ෂාවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව 2021 වර්ෂයේ ජුනි මස 18 වන දින පැවති 169 වන පාලක මණ්ඩලය වෙත මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත්කර අනුමැතිය ලබාගෙන ඇත. | අධ්‍යක්ෂවරයා විසින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ විධි විධාන අනුව පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන කටයුතු කල යුතුය. |
| (ආ) | -එම- | 2021 අගෝස්තු 31 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු සඳහා රු.12,138,421ක් පාලක සභාවේ අනුමැතියකින් තොරව වියදම් කර තිබුණි. | -එම- | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ විධි විධාන අනුව පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන ගෙවීම් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ I වගන්තිය | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතලවලට පටහැනිව විවිධ තනතුරුවල නියුතු නිලධාරීන් 08 දෙනෙකුට මොඩියුලයන් සකස් කිරීමට පැවරුම් භාර දී ඇති අතර, ඒ වෙනුවෙන් රු.460,000ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට යටත්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. එහිදී මොඩියුල සකස්කිරිම සදහා මිලගණන් කැදවා ඇති අතර එම මිල ගණන් අතුරින් අඩුම මිලගණන ඉදිරිපත් කර හා මෙම මොඩියුල සකස් කිරීම සදහා ඔවුන්ගේ ඇති වෘත්තීය සුදුසුකම් පරික්ෂා කර බලා මෙම පැවරුම් ලබා දී ඇත. | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,171,193ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,688,580 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,859,773ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විශේෂ ව්‍යාපෘති ආදායම හා පාඨමාලා ආදායම වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඩිප්ලෝමා පාඨමාලා ආදායම රු.4,917,325කින් හෙවත් සියයට 932කින් ද, විශේෂ ව්‍යාපෘති ආදායම රු.19,387,510කින් හෙවත් සියයට 835කින් ද වැඩිවී තිබෙන අතර විශේෂ ව්‍යාපෘති වියදම රු.13,334,782කින් හෙවත් සියයට 831කින්ද ඩිප්ලෝමා පාඨමාලා වියදම රු.2,985,625කින් හෙවත් සියයට 357කින්ද ඉහළ ගොස් තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ රියදුරෙකුට එරෙහිව සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු අනුව ආයතනයේ අභ්‍යන්තර විගණක රියදුරු සමඟ දූස්සන්ධානගතව ඉන්ධන ඇණවුම්පත් මඟින් මුදල් වංචාවක් සිදුකර ඇති බව පරීක්ෂණ වාර්තාවේ විනය නියෝග ගැනීම සඳහා මඟපෙන්වීම් යටතේ පෙන්වා දී තිබුණි. එහෙත් ඒ පිළිබඳ නොසලකා 2017 නොවැම්බර් 21 දින | හිටපු අභ්‍යන්තර විගණකගේ ඉල්ලා අස්වීම පිළිගන්නා ලද එවකට අධ්‍යක්ෂකවරයා ගෙන් මෙම අධිහාරය අයකරගන්නා ලෙස 171 වන පාලක සභා මණ්ඩල තීරණ කරන ලදී. | අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිහාරය අයකර ගත යුතුය. |

පැවති පාලක සභාවේ තීරණය පරිදි අදාළ අභ්‍යන්තර විගණන නිලධාරියාට උසස්වීමක් ලබා දී තිබුණි. එම නිලධාරියා 2018 ජුනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර ඔහුට හිමි පාරිතෝෂික මුදල ගෙවා නොතිබුණු හෙයින් ඔහු විසින් කම්කරු කොමසාරිස්වරයාට ඒ පිළිබඳ වාර්තා කිරීමෙන් අනතුරුව ඔහුට හිමි රු.469,287ක පාරිතෝෂික මුදල නියමිත දින නොගෙවීම නිසා රු.117,322ක අධිභාරයක් පනවා මුළු මුදල ම ගෙවන ලෙස නියෝග කර තිබුණි. 2020 පෙබරවාරි 27 දින එම මුදල ගෙවා තිබුණු අතර අධිභාරය වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර ආයතන වියදම් යටතේ දක්වා තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා 2020 වර්ෂය වෙනුවෙන් නම් 72කින් සමන්විත සම්පත්දායක ලැයිස්තුවක් සකස් කර තිබුණ ද ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. සම්පත්දායක ලැයිස්තුව සකස් කිරීමේදී සම්පත්දායක පුද්ගලයන් හඳුනාගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නැත | සම්පත්දායක නම් ලැයිස්තුව සඳහා පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර වාර්ෂිකව සම්පත්දායක ලැයිස්තුව සංශෝධනය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් දියත් කළ යුතුය. |
| (ආ) | ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය වෙන ම සම්පත්දායක ලැයිස්තුවක් පවත්වාගෙන ගොස් ඇති අතර වැඩසටහන් නිලධාරීන් ද සම්පත්දායකයින් ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. සම්පත්දායකයින් ලෙස සේවය ලබා දිය හැකි, සුදුසුකම් සහිත වැඩසටහන් නිලධාරීන් වෙතොත් ඔවුන් ද සම්පත්දායක ලැයිස්තුවට ඇතුළත් කිරීමට සුදුසු ක්‍රමවේදයක් දියත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත | විධිමත් පරිදි තෝරා ගත් සම්පත්දායකවරුන්ගේ පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය. |
| (ඇ) | සම්පත්දායක ලැයිස්තුවේ සඳහන් නොවන වෙනත් පුද්ගලයින් මූල්‍ය කළමනාකරණය, කසළ කළමනාකරණය | අදහස් දක්වා නැත | විධිමත් පරිදි තෝරා ගත් සම්පත්දායකවරුන්ගේ |

| | | | |
|---|---|---|---|
| | හා පරිසර සංරක්ෂණය, ඉංජිනේරු, නීති, පොදු කළමනාකරණ වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස සහභාගී කරවාගෙන තිබුණි. ඔවුන් ආයතනයේ පාඨමාලා හැදෑරූ පුද්ගලයින්, පළාත් පාලන ආයතනවල සේවයෙහි නියුතු ගණකාධිකාරීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හා වෙනත් ආකාරවලින් සම්බන්ධ වූ පුද්ගලයින් විය. | | පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය. |
| (ඈ) | පළාත් පාලන ආයතනවල නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුව කටයුතු නොකරන අතර ඉලක්කගත කණ්ඩායමට අමතරව අදාළ නොවන නිලධාරීන් ද සහභාගී වී තිබුණි.<br>පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම මෙන් ම අවශ්‍යතාව සහිත නිලධාරීන් සහභාගී කරවා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් නොවීම හේතුවෙන් පළාත් පාලන ආයතන මට්ටමෙන් එකම කණ්ඩායම විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමේ ස්වභාවයක් දක්නට ලැබුණි. | අදහස් දක්වා නැත | ඉලක්කගත කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු අතර මේ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් දියත් කළ යුතුය. |
| (ඉ) | පුහුණු ආයතනයක් වන මෙම ආයතනයේ සංවිධාන සටහන එම අරමුණුවලට අනුකූල වන පරිදි විධිමත් ආකාරයට සකස් කර නොතිබුණි. ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම මත වූ නව තනතුරුවලට බලතල බෙදී යන ආකාරයට ක්‍රමවත් සංවිධාන සටහනක් සකස් කර නොතිබුණි. | නව තනතුරුවල ගැටලුසහගත තත්ත්වය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් නිරාකරණය කොට ගැනීමෙන් අනතුරුව බලතල බෙදී යන ආකාරයට ක්‍රමවත් සංවිධාන සැලැස්මක් වර්තමානය වන විට සකස් කරමින් පවතී. | තනතුරුවල බලතල බෙදී යන ආකාරයට ක්‍රමවත් සංවිධාන සටහනක් සැලසුම් කළ යුතුය. |
| (ඊ) | පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පළාත් පාලන ආයතන සඳහා ගිණුම්කරණ ප්‍රමිතයක් හඳුන්වා දී තිබුණි. එම ගිණුම් ප්‍රමිතය ක්‍රියාත්මක කරවීම සඳහා පළාත් මට්ටමෙන් පළාත් නවය විසින් එම පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් රීති සම්පාදනය කළ යුතු විය. කෙසේ වෙතත් නීතිමය වශයෙන් පළාත් සභා 7ක් තුළ පිළිගැනීමට ලක් නොවී තිබියදී රු.මි.50කට අධික | අදහස් දක්වා නැත. | නව ගිණුම්කරණ ක්‍රමය සඳහා පළාත් මට්ටමෙන් රීති සම්පාදනය කළ පසුව ගිණුම්ක්‍රමය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු අතර එහිදී ප්‍රායෝගික දැනුම ලබා දීම අනිවාර්යයෙන් සිදු කළ යුතුය. |

මුදලක් වැය කර පළාත් 7හි නව ගිණුම්ක්‍රමය සම්බන්ධව පුහුණු වැඩසටහන් පවත්වා තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සඳහා මහල් 4කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2013 වර්ෂයේදී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන රු.53,196,907ක කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ලේ පයිල් අත්තිවාරම ඉදිකිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මහල් 4කට ප්‍රමාණවත් පයිල් අත්තිවාරම ඉදිකර එය මහල් 8 දක්වා වැඩි කිරීමට තීරණය කර සැලැස්ම වෙනස් කිරීම හේතුවෙන් අදාළ පයිල් අත්තිවාරම මත ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසු නොවන බව ආයතනය විසින් පිළිගෙන ඇති බැවින් මේ සඳහා දරන ලද රු. 44,757,072ක වියදම නිශ්කාර්ය වියදමක් වි තිබුණි. | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්තාවන් ලැබී ඇති බැවින් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කර ඇත. | ආයතනයේ ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු පරීක්ෂාකර බලා රජයට සිදුව ඇති අලාභයන් අයකර ගැනීමට නීතිමය කටයුතු සිදුකල යුතුය. |
| (ආ) | පයිල් අත්තිවාරමේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය පත්කර තිබූ අතර, එම ආයතනය විසින් ලබා දෙන ලද වාර්තාවෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී ඇති බවට තහවුරුවකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.918,000 ක් ගෙවා තිබුණි. | 1999 අංක 31 දරණ පලාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 5 (1) ඡේදය අනුව ආයතනයේ කටයුතු, පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ වගකීම, පාලක සභාව වෙත පැවරෙන බැවින් පාලක මණ්ඩල තීරණ 169/15 හි අනුමැතිය පරිදි ගෙවීම් සිදු කොට ඇත. | ගෙවීම් අනුමත කරන සහ සහතික කරන නිලධාරීන් සිය වගකීම නිසි පරිදි ඉටු කළ යුතුයි. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යක්ෂවරයා විසින් භාණ්ඩාගාරයෙන් නියම කරන ලද HM 2-2 වැටුප් කේතයේ 1පියවරේ වැටුප ලබා නොගෙන, එම කේතයේ 10 වන වැටුප් පියවර වූ රු.114,645ක මාසික වැටුපක් ලබාගෙන තිබූ බැවින් 2020 පෙබරවාරි සිට 2021 අගෝස්තු දක්වා රු.513,000ක මුදලක් වැඩිපුර ලබාගෙන තිබුණි. | හිටපු අධ්‍යක්ෂක වරයා විසින් වැඩිපුර ලබා ගෙන ඇති වැටුප අය කර ගැනීමට 171 වන පාලක සභා රැස්වීමේදී තීරණය විය. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | වැඩිපුර ගෙවන ලද වැටුප අයකර ගත යුතුය. |
| (ආ) | කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ඇති වූ නව තනතුරු සඳහා කාර්යමණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගැනීමට හා බඳවා ගැනීමට අදාළ වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු 2022 ජුනි 15 දින දක්වා සිදු කර නොතිබුණි. | SLIDA ආයතනය වෙතින් නව තනතුරු සඳහා SOR / SOP සැකසීමෙන් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙය කඩිනමින් සිදු කරනු ඇත. | සංශෝධනය කඩිනමින් නිසි පරිදි සිදු කළ යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 26 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියෙන්, අනුමත කළ කාර්යමණ්ඩලය යාවත්කාලීන කර ගන්නා ලෙස දක්වා තිබුණ ද පවත්නා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 2 AR-2 තනතුරුවලට අන්තර්ග්‍රහණය කර නොතිබුණි. | SLIDA ආයතනය වෙතින් නව තනතුරු සඳහා SOR / SOP සැකසීමෙන් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙය කඩිනමින් සිදු කරනු ඇත. | නිලධාරීන් අන්තර්ග්‍රහණය කර හෝ නව තනතුරු ලෙස පත්කිරීම සිදුකර අවසන් කළ යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (3) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් ගිණුම් වර්ෂය අවසන් වී මාස 10ක් ඇතුලත වාර්ෂික වාර්තාව සභාගත කල යුතු වුවත් ආයතනයේ 2019 සහ 2020 වර්ෂවල වාර්තා | අදහස් දක්වා නොමැත | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

පිළිවෙලින් මාස 30ක් සහ මාස 18ක් ගතවී තිබුණද සභාගත කර නොතිබුණි.

**4.2 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වන වගන්තිය අනුව රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම අදාළ මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට නොවැඩි කාලයකට පෙර අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුව ද 2021 වර්ෂය සඳහා පාලක සභාව විසින් අයවැය ලේඛනයක් අනුමත කර නොතිබුණි. | පාලක මණ්ඩල රැස්වීම් 2019 නොවැම්බර් මස සිට 2021 මැයි මස දක්වා නොපැවැත්වූ හෙයින් 2021 වසරේ අය වැය ලේඛනය සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. | නීතිරීති රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. අනුමත අයවැය ලේඛණයකට අනුව වියදම් කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය පාලක මණ්ඩලය රැස් වී අනුමත නොකිරීම නිසා පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු.36,680,000ක හා රු.3,100,000ක වියදම් නියමිත අධිකාරි බලය සහිතව නීත්‍යානුකූලව දරන ලද වියදම් වශයෙන් පිළිගත නොහැකි විය. | පසුගිය කාලය සඳහා වූ අයවැය ලේඛනයට ආවරණ අනුමැතිය සහ ජූනි මස සිට ඉදිරි කාලයට පූර්ව අනුමැතිය ලැබී ඇත. | වාර්ෂික අයවැය පාලක සභාව විසින් අනුමත කිරීමෙන් අනතුරුව වර්ෂයේ වියදම් දැරිය යුතු වීම. |
| (ඇ) | පාලක මණ්ඩලය විසින් 2021 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් අනුමත නොකිරීම සම්බන්ධයෙන් මුදල් හා ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PED 01/2020 චක්‍රලේඛයේ 9 ඡේදයේ සඳහන් ඇමුණුම A කෙරෙහි පාලක මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

**4.3 පාරිසරික ගැටලු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයට අදාළ පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන නොතිබුණි. | **(අ),(ආ)**. ආයතනය මගින් සිදු කරන පුහුණු අවශ්‍යතා විශ්ලේෂණ මගින් | නියමිත පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අපද්‍රව්‍ය කළමනාකරණය පළාත් පාලන ආයතනවල ප්‍රධාන කර්තව්‍යයක් වුව ද ඊට අදාළ කිසිදු පුහුණු වැඩසටහනක් හෝ වැඩමුළුවක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | පාරිසරික හා සමාජ වගකීම් පිළිබඳ අවශ්‍යතා හඳුනා ගත් අතර ඒ අනුව 2020 වසර සඳහා කසල වෙන්කිරීම්,ප්‍රතිචක්‍රීකරණය හා ඊට අදාල තාක්ෂණය පිළිබඳව පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.<br>කෝවිඩ් 19 හේතුවෙන් මෙම වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. | අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතනයේ මාධ්‍ය අංශය මගින් මත්ද්‍රව්‍ය නිවාරණ, කාන්තාවන් සවිබල ගැන්වීම වැඩමුළු බස්නාහිර පළාත සඳහා පවත්වනු ලැබූ අතර, පොදුවේ ගත්කල සියළු අංශ විසින් විවිධ පුහුණු වැඩමුළු තුළින් තිරසර සංවර්ධන අරමුණු ඍජුවම ආවරණය වන අතර එම පුහුණු වැඩමුළු මාර්ගයෙන් ලබා දෙන හා යාවත්කාලීන කරනු ලබන දැනුම මගින් මෙන්ම වැඩිදියුණු කරනු ලබන කුසලතා මගින් අනෙකුත් තිරසර සංවර්ධන අරමුණු වෙත ලඟා වීමට අවශ්‍ය මගපෙන්වීම ලබා දිමට කටයුතු කර ඇත. | එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනය කටයුතු කළ යුතුය. |